සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය **එනදු ඉල** My No DSD/HO/05/MF/01/වකුලේඛ

ඔබේ අංකය **உமது இல** Your No .....

දිනය **திகதி** Date 2023.07.11

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,
සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්.

අස්වැසුම සුභ සාධන වැඩසටහනට සමගාමීව සමෘද්ධි බැංකු වැඩසටහන ක්‍රියාත්මක කිරීම

දැනට ක්‍රියාත්මක සුභ සාධන ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන් වඩා ඵලදායී ආකාරයට හා විධිමත් පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් සුභ සාධන ප්‍රතිලාභ මණ්ඩලය මඟින් සිදු කරන ලද සමීක්ෂණ දත්ත පදනම් කර ගනිමින් ‘‘අස්වැසුම’’ නමින් නව සුභ සාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කරමින් සිටී.

02. ඒ අනුව 2023 වසරේ ජූලි මස සිට එම අස්වැසුම වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන්ට රජයේ ප්‍රධාන බැංකු හරහා සමාජ ප්‍රතිලාභ ගෙවීමට කටයුතු සුදානම් කර ඇත. මෙසේ ප්‍රතිලාභ ගෙවීමට තෝරා ගන්නා ලද පවුල් හා ප්‍රතිලාභ අහිමි වූ පවුල් සමෘද්ධි බැංකු වැඩසටහනට සම්බන්ධ වී සිටී.

03. මේ වන විට සමෘද්ධි බැංකු වැඩසටහන තුළට ගොනු වී ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති පවුල් වලින් 50%කට ආසන්න ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභීන් වන අතර අස්වැසුම වැඩසටහන යටතේ තෝරාගත් පවුල්වලට ප්‍රතිලාභ ගෙවීම වෙනත් බැංකු හරහා සිදු කිරීම තුළ සමෘද්ධි බැංකු පද්ධතියේ ණය වැඩසටහනට යම් ගැටළු සහගත තත්ත්වයක් ඇති වීමට බොහෝ දුරට ඉඩකඩ ඇත. එම බැංකුවල තැන්පතු වර්ධනයටද මෙම තත්ත්වය බලපානු ඇත.

04. එසේම මෙම අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වීම තුළ පෙර සමෘද්ධිලාභීන්ව සිට අස්වැසුම වැඩසටහනේ ප්‍රතිලාභීන් වී සිටින අය හා පෙර සමෘද්ධි සහනාධාරය තිබී අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වීමේදී ප්‍රතිලාභ අහිමි වූ අය නිරන්තරයෙන් සමෘද්ධි බැංකුවල ඇති තැන්පතු ආපසු ගැනීමට පෙළඹෙන බව වාර්තා වේ. එමෙන්ම අනිවාර්යය ඉතිරි කිරීම් මුදල්ද නිදහස් කර ගැනීමට පෙළඹෙන අතර මෙම තත්ත්වය තුළ බැංකුවල මූල්‍ය ස්ථාවරය පිරිහී ණය ලබා දීම හා ආයෝජන හැකියාව හීනවී යාමට ඉඩකඩ ඇත.

05. මේ වන විට සමෘද්ධි වැඩසටහන හා සමෘද්ධි බැංකු පද්ධතිය ගැන විවිධ බොරු කට කතා පතුරුවන්නන් සිටී. මෙය සංවිධානාත්මක කණ්ඩායම් විසින් සමෘද්ධි වැඩසටහන කඩාකප්පල් කිරීමට ගෙන යන වැඩපිළිවෙලේ ආරම්භක අවස්ථාවන් විය හැකිය. මෙම බොරු කට කතා නිසා සමෘද්ධි බැංකුවේ ගණුදෙනුකරුවන් (ප්‍රතිලාභීන්) දැඩි ලෙස කළබල වී බැංකු වෙත පැමිණ තැන්පතු ඉවත් කර ගැනීමේ වැයමක යෙදෙන බව අපට වාර්තා වේ. ඇතැම් නිලධාරීන්ද අනවබෝධයෙන් යම් යම් ප්‍රකාශ නිකුත් කර ඇති බව දැන ගැනීමට ලැබී ඇත.

06. මෙම වැරදි හා බොරු ප්‍රචාර නිසා කලබල වී ඇති සමෘද්ධි ප්‍රතිලාභීන් හා බැංකු සාමාජිකයින් ඉතා කඩිනමින් දැනුවත් කර කලබල විය යුතු තත්ත්වයක් නැති බව ඔවුන්ට පහදා දිය යුතුය. අපගේ නිලධාරීන්ද මේ මොහොතේ ඉතා බුද්ධිමත්ව කටයුතු කළ යුතුව ඇත. ඔබ සියළු දෙනා විසින් ගොඩනැගූ සමෘද්ධි බැංකු පද්ධතිය දුර්වල කිරීමට ඉඩ නොතැබිය යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ම් කට්ටම්, 4 වදු මාඩි.செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel- 011-2872202
Fax - 011-2889002
E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)
மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்)
Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி)
Director (Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය
அலுவலகம்
Office
0112872202
Hot Line: 011- 2887722

07. මේ මොහොතේ ඉතා කඩිනමින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා බැංකු මට්ටමින් ප්‍රජා නායකයින් දැනුවත් කළ යුතුය. ජාතික මට්ටමින් මේ පිළිබඳව මාධ්‍ය හරහා දැනුවත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර එය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

08. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනේදී දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු, බැංකු විෂය කළමනාකරුවන්, අධික්ෂණ නිලධාරින්, බැංකු සමිති කළමනාකරු ඇතුළු කාර්යය මණ්ඩලය බැංකු කළමනාකරු හා කාර්යය මණ්ඩල හා ක්ෂේත්‍ර නිලධාරින්ට වගකීම පැවරේ. මේ සඳහා පළපුරුදු හා සුදුසුකම් සහිත ප්‍රජා සංවිධාන සභාපතිවරුන්ද පාලක මණ්ඩල හා විධායක කමිටු සභාපතිවරුන්ද යොදා ගත යුතුය.

09. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන තම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරයාට පැවරේ.

10. ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන පැය දෙකකට හෝ තුනකට සීමා විය යුතුය. මේ සඳහා යන සංග්‍රහ වියදම ප්‍රජාමූල බැංකු සමිතියෙන් දැරිය යුතුය. මෙය ප්‍රාදේශිය මට්ටමින් සංවිධානය කිරීම වඩාත් සුදුසු වේ. මේ සඳහා සියළු පාලක මණ්ඩල සාමාජිකයින් හා විධායක කමිටු සාමාජිකයින් සහභාගි කර ගත යුතුය.

11. බැංකු බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රජාමූල සංවිධානවල නිලධාරින් කැඳවා බැංකු මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ගත යුතුය. මේ සඳහා කරුණු පැහැදිලි කළ හැකි කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන් මෙන්ම හැකියාව ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරින් හෝ වෙනත් හැකියාව ඇති නිලධාරින් හා ප්‍රජා සංවිධාන සභාපතිවරුන්/ පාලක මණ්ඩල හා විධායක කමිටු සභාපතිවරුන් යොදා ගත හැකිය. මෙම පුහුණු වැඩසටහන සඳහා තේ පැන් සංග්‍රහ කටයුතු වෙනුවෙන් යන වියදම සමෘද්ධි බැංකුව විසින් දැරිය යුතුය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් 2023.07.17 වන දින සිට ඉදිරියට මසක් ඇතුළත අවසන් කළ යුතුය.

12. ඉහත තත්ත්වයන් තුළ බැංකු පද්ධතියට ඇති වන බලපෑම අවම කර ගැනීමට බැංකු කළමනාකාරිත්වය හා බැංකු හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩල මනා සැලැස්මකින් යුතුව බැංකු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

13. මෙම අස්වැසුම වැඩසටහනට සමගාමීව සමෘද්ධි බැංකු කළමනාකාරිත්වය පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර ඉදිරි සැලසුම් සකස් කර ගැනීම කළ යුතුව ඇත.

01. වර්තමානයේ සිටින සමෘද්ධි බැංකු සාමාජිකයින් බැංකුව තුළ රඳවා ගැනීම.
02. නව සාමාජිකයින් බඳවා ගැනීම (සාමාජිකත්වය වර්ධනය කිරීම)
03. සමෘද්ධි බැංකු පද්ධතියේ ආයතන හා මූල්‍ය පරිපාලනය නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීම.
04. සමෘද්ධි බැංකුව හා බැංකු සමිතිය ස්වාධීන ඒකක ලෙස ක්‍රියාත්මක විය හැකි ආකාරය.

14. දැනට තොරතුරු ලැබී ඇති ආකාරයට අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීමට තෝරා ගෙන ඇති පවුල් අතරින් පවුල් ලක්ෂ 12ක් පමණ සවිබල ගැන්වීමේ වැඩසටහනට තෝරා ගන්නා බව සඳහන්ව ඇත.

15. මෙහිදී සමෘද්ධි බැංකු විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් වනුයේ මෙම පවුල් ලක්ෂ 12න් බැංකු වැඩසටහනට සම්බන්ධ වී නැති පවුල් සමෘද්ධි බැංකු වැඩසටහනට සම්බන්ධ කර ගැනීමේ කාර්යය භාරයයි. මෙය අප විසින් කළ යුතු ප්‍රමුඛතම කාර්යයක් වනු ඇත.

16. මෙහිදී බැංකු කළමනාකාරිත්වයේ, ක්ෂේත්‍රගත හා බැංකු කාර්යය මණ්ඩලයේ යහපත් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුවා සේම පාරිභෝගික සත්කාරය පිළිබඳව වර්තමානයට ගැලපෙන පරිදී මනා පුහුණුවක් ලබා දිය යුතුය. මෙම කටයුතු ඉතා කඩිනමින් සිදු කළ යුතු බව සඳහන් කරමි.

17. දිස්ත්‍රික් මට්ටමින් සමෘද්ධි කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන්, පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2023.07.17 වන දිනට පෙර පැවැත්වීමට කටයුතු සුදානම් කර ගත යුතුය. ප්‍රජාව දැනුවත් කිරීමට පෙර මෙම නිලධාරින් දැනුවත් කිරීම කළ යුතුය. මේ සඳහා වැඩිදුර උපදෙස් ඇමුණුම 01 මඟින් ඔබ වෙත ලබා දී ඇත. ඒ අනුව කටයුතු කළ යුතුය.

18. ලබා දී ඇති උපදෙස් අනුව අදාළ කටයුතු සංවිධානය කර ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වන අතර ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් ගරු රාජ්‍ය අමාත්‍ය අනුප පැස්කුවල් මැතිතුමා - කා.දැ.ගැ.ස
02. ලේකම්, කන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
04. අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන) - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
05. අධ්‍යක්ෂ (මහා සංගම්) - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

ප්‍රජා නායකයින් හා නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන

01. 2023.07.17ට පෙර දිස්ත්‍රික් මට්ටමින් නිලධාරි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා අවසන් කළ යුතුය. මේ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සමෘද්ධි කළමනාකරුවන්, බැංකු සහකාර කළමනාකරුවන්, කලාප සහකාර කළමනාකරුවන්, පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන් කැඳවිය යුතුය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සෙනසුරාදා හෝ ඉදිරි යොදා ගැනීම වඩාත් සුදුසු වේ.

02. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පැය 03කට හෝ 4කට සීමා කළ යුතුය. මේ සඳහා කෙටි කෑමක් සමඟ තේ එකක් ලබා දීම ප්‍රමාණවත් වේ. නිලධාරි සංඛ්‍යාව වැඩි දිස්ත්‍රික්කවලට උදේ හා සවස වශයෙන් වැඩසටහන් යොදා ගත හැකිය.

03. මේ සඳහා යන සංග්‍රහ වියදම් ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් දිස්ත්‍රික්වලට ලබා දෙන අතර අදාල ඇස්තමේන්තු ඉතා කඩිනමින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය. මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් රැස්වීම් ශාලා හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඇති රැස්වීම් ශාලා යොදා ගැනීමට කටයුතු කරන්න.

04. මෙම දැනුවත් කිරීමේ කටයුත්ත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ, බැංකු විෂය කළමනාකරුවන්, අධික්ෂණ ඒකකයේ කළමනාකරුවන් විසින් කළ යුතුය. ඒ වගේම දිස්ත්‍රික්කයේ බැංකු හා බැංකු සමිතිවල සිටින විශේෂ දක්ෂතා ඇති ජ්‍යෙෂ්ඨ සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි කළමනාකරුවන්, පාලක මණ්ඩල හා විධායක කමිටු සභාපතිවරුන්ද යොදා ගත හැක.

05. මෙම දැනුවත් කිරීමේ වැඩසටහනේදි පහත සඳහන් කරුණු පිළිබඳව දැනුවත් කළ යුතුය.
    - සමෘද්ධි බැංකු වැඩසටහන ගොඩනැගී ඇති ආකාරය හා එහි වර්තමාන තත්ත්වය (සමෘද්ධි බැංකු සංඛ්‍යාව1089, සමෘද්ධි බැංකු සමිති 335, කුඩා කණ්ඩායම් 450,000, ප්‍රජාමූල සංවිධාන 30,000, සාමාජික කොටස් ලක්ෂ 41)

    - වර්තමාන සමෘද්ධි බැංකු වැඩසටහනේ මූල්‍ය ස්ථාවරතාවය

මුළු වත්කම් ප්‍රමාණය	රු. බිලියන 255 වේ.
මුළු මූල්‍ය වත්කම් ප්‍රමාණය	රු. බිලියන 220
මුළු තැන්පතු ප්‍රමාණය	රු. බිලියන 171
ආයෝජන ප්‍රමාණය	රු. බිලියන 150
පිටහිටි ණය ප්‍රමාණය	රු. බිලියන 70
බැංකු සතු අනිකුත් අරමුදල්	රු. බිලියන 49

      දැවැන්ත මූල්‍ය ස්ථාවරත්වයක් බැංකු සතු බව පැහැදිලි කළ යුතුය.

    - අස්වැසුම සුභසාධන වැඩසටහන ගැන පැහැදිලි කළ යුතුය. මෙය සහනාධාර වැඩපිළිවෙලක් බවත් මෙම ආධාරය වඩා විනිවිදභාවයකින් ප්‍රතිලාභියාගේ බැංකු ගිණුමට ලබා දීම අරමුණු කරගෙන රජයේ බැංකු හරහා ලබා දෙන බව පැහැදිලි කළ යුතුය.

    - අස්වැසුම නිසා සමෘද්ධි වැඩසටහනට බලපෑමක් නොවන බවත් සමෘද්ධි වැඩසටහනේ සියළු වැඩසටහන් පෙරසේම ක්‍රියාත්මක වන බවත් දැනුවත් කළ යුතුය.

    - මේ වන විට වැරදි බොරු ප්‍රචාර පැතිර යන බවත් එහි සත්‍යතාවක් නොමැති බවත් එම ප්‍රචාරණවලට හසු නොවන ලෙසත් දැනුවත් කළ යුතුය.

    - මේ වන විට සමෘද්ධි බැංකු පද්ධතියේ තැන්පතු මුදල් හා අනිකුත් අරමුදල්වලට කිසිම බලපෑමක් සිදු නොවන බවට හා බැංකු පද්ධතිය ස්වාධීන ඒකක ලෙස ක්‍රියාත්මක වන නිසා කිසිම පාර්ශ්වයකට මේ සඳහා බලපෑම් සිදු කළ නොහැකි බව සඳහන් කළ යුතුය.

- රජය විසින් Covid – 19 වැඩසටහන සමයේ සමාජ ප්‍රතිලාභ ගෙවීම සඳහා බැංකුවලින් හා ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබා ගත් මුදල් සියල්ල නැවත ලබා දෙන බවට පොරොන්දු වී ඇති අතර එම මුදල් කොටස් වශයෙන් අප වෙත ලබා දීම ආරම්භ කර ඇත. ඒ අනුව, බැංකුවල මූල්‍ය ස්ථාවරබාවයට බලපෑමක් සිදු නොවේ.

- අස්වැසුම වැඩසටහන තුළ පවුල් ලක්ෂ 12ක් සවිබල ගැන්වීමේ වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. ඒ අනුව සහනාධාරය වෙනත් බැංකු වලින් ලබා ගන්නන් එම පවුල් ලක්ෂ 12ක ප්‍රමාණය ඉදිරියේ සමෘද්ධි බැංකු වැඩසටහනට සම්බන්ධවනු ඇත.

- සමෘද්ධි බැංකු සේවාවන් තවත් පුළුල් කරමින් සමස්ථ ප්‍රජාවට බැංකුව ඉදිරියේදී විවෘත වනු ඇත. ඒ අනුව, පුළුල් දැක්මකින් සමෘද්ධි බැංකු ක්‍රියාත්මක වනු ඇත.

- තරුණ ප්‍රජාව හා සහනාධාර නොලබන පවුල් ඉදිරියේ සමෘද්ධි බැංකුවට සම්බන්ධ කර ගැනීමේ පුළුල් වැඩපිළිවෙලක් බැංකු හා වසම් මට්ටමින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

- බැංකු වැඩසටහන තුළ ඉදිරියේදී,
  - අඩුම පොලියට ණය ලබා දීම.
  - තනි පුද්ගල ණය ලබා දීම.
  - පුද්ගල හා දේපල ඇපමත ණය ලබා දීම.
  - රාජ්‍ය සේවකයන්ට ණය වැඩසටහන් හදුන්වා දීම.
  - ණය සීමාවන් පුළුල් කිරීම වර්තමානයට ගැලපෙන පරිදි.
  - ණය රක්ෂණ ක්‍රමයක් හදුන්වා දීම.
  - රන් සුරකුම් උකස් ණය වැඩසටහන් හදුන්වා දීම.
  - තරුණ ප්‍රජාවට සහන පොලියට විශේෂ ණය වැඩසටහන් හදුන්වා දීම.
  - තැන්පතු සඳහා තරඟකාරී පොලි අනුපාත ලබා දීම.

- සමෘද්ධි ජාතික මහ සංගමය ක්‍රියාත්මක වීමත් සමඟ බැංකු ස්වාධීන ඒකක ලෙස ශක්තිමත් වීම.

- මෙහිදී අස්වැසුම වැඩසටහන සමෘද්ධි බැංකු පද්ධතියේ හැරවුම් ලක්ෂය ලෙස යොදා ගැනීමට උපදෙස් දෙන්න.

- බැංකුකරණය ආරම්භ කළ යුත්තේ දැන් බව සියළු බැංකු නිලධාරින්ව දැනුවත් කරන්න. දැන් තැන්පතු බැංකුවට ගෙනවිත් දෙන අය නැත. තැන්පතු බැංකුවට ගෙන්වා ගත යුතුය. ඒ සඳහා බැංකුකරුවෙකු ලෙස කටයුතු කළ යුතු බව දැනුවත් කරන්න. එසේ කටයුතු කළහොත් බැංකු පද්ධතිය ප්‍රසස්ථ මට්ටමින් ලාභදායි ඒකක ලෙස පවත්වා ගෙන යා හැකිය.

06. නිලධාරින් දැනුවත් කිරීම අවසන් වූ පසු ප්‍රාදේශිය මට්ටමින් පාලක මණ්ඩල සාමාජිකයින් හා විධායක කමිටු සාමාජිකයින් දැනුවත් කළ යුතුයි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහනට වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින්ද කැඳවිය යුතුයි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පැය 03කට පමණ සීමා කර ගත යුතුය. මෙහිදී සුදුසු නිලධාරින් යොදවා දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්විය යුතුය. මේ සඳහා යන සංග්‍රහ වියදම බැංකු සමිතියෙන් දැරිය යුතුය. එක් අයෙකු සඳහා උපරිම රු. 200/- වියදම් දැරිය හැකිය. වියදම් පාලනය කර ගැනීමට සමෘද්ධි බැංකු සමිති කළමනාකරු කටයුතු කළ යුතුය.

07. ඉහත දැනුවත් කිරීමේ වැඩසටහන අවසන් වූ විගස ප්‍රජාමූල සංවිධානවල නිලධාරි 5දෙනා කැඳවා බැංකු මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය. මෙහිදී ප්‍රජාමූල සංවිධානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප ලේකම්, උප සභාපති සහභාගි කර ගත යුතුය. මෙහිදී වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහනට ප්‍රජා නායකයින් සම්බන්ධකරවීමේ වගකීම දැරිය යුතුය. දැනුවත් කිරීමේ වැඩසටහනේ සම්පූර්ණ සංවිධාන කටයුතු සමෘද්ධි බැංකු කළමනාකරු විසින් කළ යුතුය. සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරු අධීක්ෂණය කළ යුතුය. සුදුසු නිලධාරින් දැනුවත් කිරීම සඳහා යෙදවිය යුතුය. මේ සඳහා යන සංග්‍රහ වියදම් සමෘද්ධි බැංකුව විසින් දැරිය යුතුය. එක් අයෙකු සඳහා උපරිම රු. 200/- වියදමක් දැරිය හැකිය. වියදම් පාලනය කර ගැනීමට බැංකු කළමනාකරු කටයුතු කළ යුතුය.